**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1972 අංක 5 දරන ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය, ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක ආයතනය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරයෙකු විසින් පරිත්‍යාග කරන ලද රු. 742,000 ක් වටිනා පරිගණකයක වටිනාකම සදොස් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර වත්කම් මිලදී ගැනීමක් ලෙස සහ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ප්‍රාග්ධන ආධාර ලැබීමක් ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීමේ මුදල් ප්‍රවාහය රු. 2,107,135 ලෙස දැක්වුවද එහි භාණ්ඩ ප්‍රදානද ඇතුළත් වී ඇත. නිවැරදි අගය රු. 1,381,469 කි. මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ප්‍රාග්ධන මූල්‍යමය ආධාරය රු. 579,100 ලෙස නිවැරදි විය යුතුය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදලින් සිදුවන ගනුදෙනු පමණක් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | වී අලෙවි මණ්ඩලයට 2020 පෙබරවාරි 07 දින සිට සම්පූර්ණයෙන්ම මුදා හැර ඇති ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකුට 2020, 2021 හා 2022 වර්ෂවලදී ගෙවන ලද රු. 4,327,214 ක වැටුප වී අලෙවි මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණු අතර එය ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම් වල හෙළිදරව් කර නොතිබුණි. | එකඟ වෙමි.<br>හෙක්ටර් කොබ්බෑකඩුව හා වී අලෙවි මණ්ඩලය කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් රාජ්‍ය ආයතන වන අතර වැටුප් ගෙවීම හෝ ප්‍රතිපූර්ණය කර ගැනීම පිළිබඳව කිසිදු තීරණයක් පාලක මණ්ඩලය විසින් ලබා දී නොතිබුණි. නමුත් 2022 නොවැම්බර් මස පැවති පාලක මණ්ඩලයේදී තීරණය අනුව 2022 නොවැම්බර් මස සිට අදාළ වැටුප ප්‍රතිපූර්ණ කිරීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය වී ඇත. ඒ අනුව වී අලෙවි මණ්ඩලයෙන් අදාළ මුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහා කටයුතු කර ඇත. | නිදහස් කරන ලද නිලධාරීන්ගෙන් අයවිය යුතු වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්.

### 1.6.1 ලැබිය යුතු මුදල්.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකු දර්ශනපති උපාධි පාඨමාලාවක් (Ph.D) හැදෑරීම සඳහා 2011 වර්ෂයේ සිට වර්ෂ 02 ක වැටුප් සහිත අධ්‍යයන නිවාඩු හා තවත් වර්ෂ 02 ක වැටුප් රහිත අධ්‍යයන නිවාඩු මත විදේශ ගත වී නැවත ආයතනයේ සේවයට පැමිණ ඇති නමුත් ගිවිසුම් ප්‍රකාරව නියමිත කාල සීමාවේදී දර්ශනපති උපාධිය සම්පූර්ණ කර උපාධි සහතික ලබාදීමට අසමත් වීම මත ඔහු විසින් ආයතනය සමඟ එළඹ ඇති බැඳුම්කර වටිනාකම වන රු. 9,039,682 ක මුදල අය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ මුදල් ගෙවන ලෙස එම ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි වෙත ලිඛිතව දන්වා ඇත. මේ පිළිබඳ වැඩිදුර උපදෙස් සඳහා පාලක මණ්ඩල පත්‍රිකාවක් ඊලඟ පාලක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | විදේශ ශිෂ්‍යත්ව සඳහා ගොස්ඇති නිලධාරීන්ගෙන් ගිවිසුම කඩ කිරීම හේතුවෙන් අය කළ යුතු මුදල් කඩිනමින් අය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනියක් ආයතනය සමඟ එළඹ ඇති ගිවිසුමේ උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ යුතු කාල සීමාව දක්වා නොතිබුණු අතර 2016 අප්‍රේල් 01 දින ආරම්භ කළ උපාධිය සඳහා වර්ෂ 07 ක කාලයක් ගතවී ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් උපාධිය සම්පූර්ණ කර එම සහතිකය ආයතනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ගෙවන ලද රු. 223,500 ක පාඨමාලා ගාස්තු මුදල නැවත අය කරගෙන නොතිබුණි. | අධි පර්යේෂක නිලධාරී වෙත ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීම සඳහා අතිරේක කාලයක් ලබා දී ඇත. එම කාල සීමාව තුළ අදාළ උපාධිය සම්පූර්ණ කිරීමට අපොහොසත් වුවහොත් ඇයට ගෙවන ලද දීමනා හා වැටුප් වර්ධක අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | නියමිත කාල සීමාව තුළ උපාධිය සම්පූර්ණ නොකළ නිලධාරීන්ගෙන් ගිවිසුම කඩ කිරීම හේතුවෙන් අය කළ යුතු මුදල් කඩිනමින් අය කරගත යුතුය. |
| (ඇ) | චීනයේ විශ්ව විද්‍යාලයකින් දර්ශනපති උපාධියක් හැදෑරීම සඳහා පර්යේෂණ නිලධාරියෙකු විසින් වර්ෂ 03 ක අධ්‍යයන නිවාඩු ලබාගැනීමේදී ආයතනය සමඟ එළඹ තිබුණු ගිවිසුමට අනුව උපාධිය සම්පූර්ණ කර ආයතනයට වර්ෂ 10 ක අවම සේවා කාලයක් සේවය කළ යුතු වුවත් වර්ෂ දෙකක් සේවය කර 2022 මාර්තු 29 දින අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය මත 2022 අප්‍රේල් 25 දින සිට නැගෙනහිර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය තනතුර සඳහා ආයතනයේ රාජකාරීවලින් නිදහස් කර තිබුණි. එහෙත් ඔහුගෙන් ආයතනයට අයවිය යුතු රු. 5,272,016 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කරගෙන නොතිබුණි. | පර්යේෂණ නිලධාරී නියමිත ඇප බැඳුම්කර හා ගිවිසුම් අනුව නියමිත කාල සීමාව අවසන් කිරීමට පෙර ආයතනයේ සේවයෙන් ඉවත්ව ගොස් ඇති බැවින් ගිවිසුම් ප්‍රකාරව ආයතනයට අයවිය යුතු මුදල ගෙවන ලෙස ඔහු වෙත දන්වා ඇතත් මේ වන විටත් එම මුදල් ගෙවා නොමැත. ඔහුගෙන් එම මුදල් අයකර ගැනීම සඳහා ඔහුට විරුද්ධව නඩු පැවරීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත. | විදේශ ශිෂ්‍යත්ව සඳහා ගොස් නැවත පැමිණ නියමිත සේවා කාලය සම්පූර්ණ නෙකළ නිලධාරීන් විසින් ආයතනයට ගෙවිය යුතු මුදල් අයකර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 18,131,898 ක් වූ විදේශ ශිෂ්‍යත්ව ණයගැති ශේෂය තුළ නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 12,859,882 ක මුදලක් වර්ෂ 10 කට වැඩි කාලයක සිට පැවත එන අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට ආයතනයේ 2002 වර්ෂයට පෙර සිට පැවත එන විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් 06 දෙනෙකුගේ රු. 12,859,881 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. 05 දෙනෙකුගේ වර්තමාන ලිපිනයන් සොයා ගැනීමට නොහැකි වීම නිසා ණය අයකර ගැනීමේ ඉදිරි පියවර ගැනීමට නොහැකි වී ඇති අතර අනික් නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල 2011.11.23 ලබා දුන් නඩු තීන්දුව අනුව අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. | අයවිය යුතු ශේෂ නොපමාව අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අමාත්‍යවරයාගේ ආරක්ෂක නිලධාරීන් සඳහා නේවාසිකාගාරයේ කාමර කුලියට දීම වෙනුවෙන් 2015 මැයි සිට 2018 ජූලි මස දක්වා කාලයට අයවිය යුතු රු. 8,895,470 ක මුදල අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එවකට සිටි කෘෂිකර්ම අමාත්‍යතුමාගේ වාචික නියෝගය අනුව අමාත්‍යවරයාගේ ආරක්ෂක නිලධාරීන් සඳහා නේවාසිකාගාර කාමර ලබා දී තිබූ අතර ඒ සඳහා බිල්පත් (invoice) නිකුත් කර නොමැත. අදාළ නවාතැන් ලබාගත් නිලධාරීන්ගේ තොරතුරු ද සොයා ගැනීමට අපහසු වී ඇති අතර එම මුදල් අයකර ගත යුතු වගකිව යුතු නිලධාරීන්ද සොයා ගැනීමට නොහැකි වී ඇත. එවකට සිටි අධ්‍යක්ෂවරයාගේ වාචික උපදෙස් අනුව මෙම කාමර ලබා දී ඇත. | අයවිය යුතු ශේෂ නොපමාව අයකර ගත යුතුය. නේවාසිකාගාරය විසින් පවත්වනු ලබන රෙජිස්ටරයේ නවාතැන් ගන්නා නිලධාරීන්ගේ හෝ සේවකයින්ගේ සවිස්තර තොරතුරු ඇතුළත් කොට පවත්වාගෙන යාම සිදුකළ යුතුය. |
| (ඊ) | ආයතනය සතු NIKON D 3100 වර්ගයේ කැමරාව අස්ථානගත වීම සම්බන්ධයෙන් වූ විධිමත් විනය පරීක්ෂණ කමිටු නිර්දේශය අනුව එහි රු. 29,086 ක සම්පූර්ණ අලාභය හිටපු අධ්‍යක්ෂ දැරිය යුතු බවට නිර්දේශ කර ඇතත් එම මුදල අයකර ගැනීමට අවශ්‍ය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මු.රෙ. 104 පරීක්ෂණය අනුව ඒ සඳහා වගකිව යුතු ලෙස හිටපු අධ්‍යක්ෂ නම් කර ඇත. ඔහු වෙත මේ පිළිබඳව අවස්ථා කීපයක දී දන්වන ලද අතර මේ දක්වා කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත. ඔහුගෙන් අයවිය යුතු මුදල රු. 29,086 ක් වන අතර නීති මඟින් කටයුතු කර අයකර ගැනීම සඳහා ඉදිරියේ දී කටයුතු කිරීමට අපේක්ෂා කරමි. | අයවිය යුතු ශේෂ නොපමාව අය කර ගත යුතුය. |
| (උ) | අනෙකුත් ණයගැති ශේෂය තුළ පවතින රු. 737,423 ක ශේෂය වර්ෂ 05 ක කාලයක සිට පැවත එන අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මොබිටෙල් ආයතනයෙන් අයවිය යුතු ශේෂය කඩිනමින් ගෙවීමට එකඟ වී ඇත. ලැබිය යුතු නේවාසිකාගාර ආදායම, ලැබිය යුතු ශ්‍රවණාගාර ආදායම හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ආදායම ඉදිරියේදී පැවැත්වීමට නියමිත විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත්කර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරමි. ආයතනයෙන් ඉවත් වූ සේවකයින්ගේ ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | අයවිය යුතු ශේෂ නොපමාව අයකර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xv වැනි පරිච්ඡේදයේ 5.1 වගන්ති | අධ්‍යයන හෝ අභ්‍යාස සඳහා අවම වශයෙන් ගමන සඳහා ගතවන කාලයද ඇතුළුව එක් මසකට වැඩි කාලයක් වැටුප් රහිත නිවාඩු ලබා එතෙර යන නිලධාරියෙකු එම නිවාඩු අවසන් වී සේවයට පැමිණෙන බවත් ඔහු විසින් ගන්නා ලද වැටුප් රහිත කාලය මෙන් දෙගුණයකට සමාන කාලයක් ආණ්ඩුවට සේවය කරන | පර්යේෂණ නිලධාරී දැනට සේවයෙන් ඉල්ලා අස් වී ඇති අතර ඇප බැඳුම්කර හා ගිවිසුම් අත්සන් කිරීම සිදු නොකළ බැවින් ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව ඔහුගෙන් අයකර ගත යුතු මුදලින් කොටසක් අයකර ගෙන ඇති අතර (පාරිතෝෂික මුදලෙන්) | නිලධාරියාන් හෝ ඇප කරුවන්ගෙන් අදාළ මුදල අයකර ගත යුතුය.මෙවැනි වැරදි නැවත සිදු නොකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | බවට ගිවිසුමකට එළඹිය යුතු වුවත් 2021 සැප්තැම්බර් 25 දින සිට 2022 සැප්තැම්බර් 10 දින දක්වා එක්සත් රාජධානියේ පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා වසරක කාලයකට විදේශගත වූ පර්යේෂණ නිලධාරියෙකු සමඟ එවැනි ගිවිසුමකට එළඹ නොතිබුණි. | තවත් ආයතනයට ගෙවිය යුතු රු. 71,206 මුදලක් ඉතිරිව ඇත. එම මුදල ගෙවන ලෙස ඔහු වෙත දන්වා ඇති අතර අදාළ මුදල නොගෙවන්නේ නම් නීති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ) | xix වැනි පරිච්ඡේදයේ 5.8 වගන්තිය | ලේඛකාධිකාරී නිල නිවසේ ජල සම්බන්ධතාවය ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් 2018 මැයි 14 දින විසන්ධි කිරීම හේතුවෙන් එදින සිට එම නිල නිවාසයට අදාළ සැපයුමෙන් ලබාදී ඒ සඳහා ආයතනය විසින් ජලාපවාහන මණ්ඩලයට ගාස්තු ගෙවා තිබුණද 2018 මැයි 14 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා ආයතනය විසින් ගෙවන ලද මුදල් අදාළ නිලධාරියාගෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | නිල නිවාස 02 සඳහා නව විදුලි හා ජල මීටර් සවිකර ඇති අතර නියමිත පරිදි අදාළ නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. | නිල නිවාස භාවිතා කරන නිලධාරීන්ගෙන් නොගෙවූ විදුලිය හා ජලය වෙනුවෙන් රජයට අයවිය යුතු මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)<br>(i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ<br>මු.රෙ. 104 | රු. 1,067,150 ක් වූ ජීව වායු ව්‍යාපෘතිය 2016 වර්ෂයේ සිට අක්‍රිය වීම සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂණයකින් පසු 2022 ජූනි 23 දින ඉදිරිපත් කර තිබෙන ටෙන්ඩර් මණ්ඩල වාර්තාව අනුව හිටපු අධ්‍යක්ෂකවරයා හා අනෙකුත් නිලධාරීන්ද සම්බන්ධ වී ටෙන්ඩර් පටිපාටිය උල්ලංඝනය කර අමතර කොටස් මිළදී ගෙන යෙදීම නිසා, එහි ක්‍රියාකාරිත්වයට බාධා වූ බවට නිගමනය කර තිබියදී එම අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පාලක මණ්ඩලයේ උපදෙස් පරිදි එම ජීව වායු ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අලුත්වැඩියා කිරීමට ඇස්තමේන්තු වාර්තාවක් අදාළ ව්‍යාපෘති සිදුකළ ආයතනයෙන් ලබා ගන්නා ලෙස දන්වන ලද අතර ඒ අනුව එකී සමාගම විසින් ඇස්තමේන්තු වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එම වාර්තාව පාලක මණ්ඩලය වෙත යොමු කරන අතර ඉදිරි කටයුතු පාලක මණ්ඩලයේ උපදෙස් අනුව කටයුතු කරනු ලැබේ. | අප්‍රමාදව පරීක්ෂණ කමිටු වාර්තාව ලබාගෙන එහි නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |
| (ii) | මු.රෙ. 1646 | වාහන 07 කට අදාළ ධාවන සටහන් වල මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මු.රෙ. 1646 ප්‍රකාරව මාසික සාරාංශ හා දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 5,391,622 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 12,133,601 ක් විමෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ රු. 6,741,979 ක අතිරික්තයේ අඩුවීමක් නිරීක්ෂණය විය. අනෙකුත් වියදම් රු. 10,250,745 කින් වැඩිවීම, පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා වියදම රු. 5,135,144 කින්,වැටුප් හා වේතන රු. 9,447,716 කින් වැඩිවීම මෙම මූල්‍ය ප්‍රතිඵලය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂය සමඟ සමාලෝචිත වර්ෂය සැසඳීමේදී රජයේ ප්‍රදාන හා ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් සියයට 3.6 කින් හා 66.7 කින් වැඩිවී තිබුණු අතර වෙනත් ආදායම් සියයට 32 කින් හා පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා වෙනත් පාර්ශවයන්ගෙන් ලද අරමුදල් සියයට 735.6 කින්ද වැඩි වී තිබුණි. එසේම පර්යේෂණ හා පුහුණු වියදම් සියයට 66.7 කින්, වෙනත් පාර්ශවයන් සඳහා පර්යේෂණ හා පුහුණු වියදම් සියයට 735.6 කින් හා වෙනත් වියදම් සියයට 36.2 කින් වැඩිවී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම් අතිරික්ත අනුපාතය සියයට 3.7 කින් අඩුවී ඇති අතර ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙළින් සියයට 0.23 කින් හා සියයට 0.17 කින් අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ජනවාරි 25 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2022 ප්‍රකාරව ධාවනයෙන් ඉවත් කර ඇති වාහන 03 ක් හා මෝටර් සයිකල් 04 ක් අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | ආයතනයේ ධාවනයෙන් ඉවත් කර ඇති වාහන 03 නැවත අලුත්වැඩියා කිරීමට තීරණය කර ඇති අතර ප්‍රතිපාදන ලැබෙන ප්‍රමාණය අනුව ක්‍රමයෙන් එම වාහන අලුත් වැඩියා කිරීමට අපේක්ෂා කරනු ලැබේ.<br>මෝටර් සයිකල් හතරෙන් එක් යතුරු පැදියක් ධාවන තත්ත්වයේ පවතින අතර ඉතිරි යතුරු පැදි 03 අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම වාහන අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ අලුත්වැඩියා කළ නොහැකි නම් අපහරණය කළ යුතුය. |